# 'පට්ඨාන' දාහත්වැනි දේශනාව

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස

තුන් ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන්වහන්සේ පාරමී ධර්ම භූමියේදී සියලුම ධර්මයන් අවබෝධ කරගැනීමට සමත් සර්වඥතාඥානය ප්‍රාර්ථනා කරගෙන සම්මා සම්බුද්ධත්වය ප්‍රාර්ථනා කරගෙන පාරමී ධර්ම විසිතුරු ආකාරයෙන් වඩාගත්ත. ඒ වඩා ගත්තාවූ පාරමී ධර්මයන්ගෙන් පෝෂණය උනාවූ සන්තානයක් ඇති සම්මා සම්බුදුරජාණන්වහන්සේට සර්වඥතාඥානයෙන් පිරිපුන් සන්තානයක් ඇති සම්මා සම්බුදුරජාණන්වහන්සේට සියලුම කෙලෙසුන් නසා පිරිසිදු සන්තානයක් ඇතිකර ගත්තාවූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට සියලුම සත්වයන් කෙරෙහි පතලා වූ මහා කරුණා ගුණයකින් තෙත් වූ ලයක් ඇති සම්මා සම්බුදුරජාණන්වහන්සේට අනන්ත වූ අපරිමාණ ගුණ ඇත්තාවූ සම්මා සම්බුදුපියාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ සම්මා සම්බුදුරජාණන්වහන්සේගේ උතුම් බුදු නුවණින් අවබෝධ කොට ගත්තාවූ දේශනාකොට වදාළා වූ ශ්‍රී සද්ධර්ම රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් ධර්මය අනුගමනය කරමින් සුපටිපන්න ආදී ගුණ දරාගෙන ඒ ධර්ම මාර්ගයේ ගමන් කොට ආර්ය භාවයට පත් වුනාවූ ආර්ය මාර්ගයේ ගමන් කරන්නාවූ අෂ්ටආර්යපුද්ගල මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ බුද්ධ රත්නයේ ආනුභාව බලයෙන් ධර්ම රත්නයේ ආනුභාව බලයෙන් සංඝ රත්නයේ ආනුභාව බලයෙන් තුනුරුවන්ගේ ගුණ සිහිපත්කොට වන්දනා කිරීමේ කුසල චේතනාවේ ආනුභාව බලයෙන් මේ පිංවත් සැම දෙනාම සිදුකරගත්තවූ දානමය සීලමය භාවනාමය ගුණ ධර්මයන්ගේ ආනුභාව බලයෙන් කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන් අදත් අපි මේ සාකච්ඡා කරන්ට ඉගෙන ගන්ට යන ධර්ම කරුණු ටික සැමදෙනාටම හොඳින් වැටහේවා! තේරුම් ගන්ට ලැබේවා! හොඳින් අවබෝධ වේවා! ඒ සඳහා කිසිම ක්ලේශ බාධකයක් නොවේවා! සිහිය නුවණ පවත්වාගෙන මේ කෙටියෙන් නමුත් කියල දෙන කරුණු ටික හොඳින්ම තේරුම් අරගෙන සිහිය නුවණ ශ්‍රද්ධාව පහළ කරගන්ටත් ලැබේවා! එය මාර්ගයක් කරගෙන ප්‍රතිපදාවක් කරගෙන බුද්ධාදී ආර්ය උතුමන්වහන්සේලා අවබෝධ කරගත්ත නිවනින් සැනසෙන්ට ලැබේවා! නිවන් පිණිස මේ පිං මේ ධර්ම දේශනාව හේතුවේවා! කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. අද ඒ මෛත්‍රී පූර්වාන්ගම ප්‍රාර්ථනාවත් එක්ක මේ පින්වතුන්ට මම විශේෂ ධර්ම කරුණු ටිකක් කියල දෙනවා.

දැන් අලුතෙන් එක්කාසු වෙලා ඉන්නා වූ පින්වතුනුත් ඉන්නවා බොහොම දීර්ඝ කාලයක් තිස්සේ මේ දහම් වැඩ සටහනට සහ සම්බන්ධ වෙලා කටයුතු කරගෙන යන ධර්මය ඉගෙන

ගන්න පිරිසකුත් ඉන්නවා. ඉතින් සමහර අයගේ දැනුම යම්කිසි තත්වයක තියෙනවා. සමහර පින්වතුන් ධර්‍ම දැනුම වඩා ගනිමින් ඉන්නවා. ඉතින් හැම දෙනාටම ප්‍රයෝජනවත් වෙන විදියට නැවත වතාවක් අපි අපේ ගමන් මඟ කෙටියෙන් හිතා ගන්ට ඕන.

මේ අභිධර්ම කොට්ඨාසයේ බොහෝම සියුම් විදියට මේ ධර්‍ම විවරණය කෙරෙන්නේ. මේක සූත්‍රයේ විස්තර කරන එකක් නෙවෙයි. මේකට 'අභිධර්ම කාණ්ඩය' කියල වෙනමම නමක් තබාගෙන විශේෂ විස්තරයක් කියල සඳහන් වෙන්නේ එහෙම කොටසක් තියෙන නිසා. මේ විස්තර කිරීමේ ක්‍රමය - න්‍යායේ පිහිටා විස්තර කරන්නාවූ ක්‍රමය මහා ප්‍රඥාවන්ත බුදුරජාණන්වහන්සේගේ ප්‍රශංසාවට ඒවාගේම කරුණාවට වර්ණනාවට භාජනය වූ සාරිපුත්‍ර මහා රහතන් වහන්සේ තමයි මේක ලස්සනට මේ විදියට විස්තර කරලා දෙන්නේ. ඒ විස්තර කිරීමට බුදුරජාණන්වහන්සේ මාතෘකා කරුණු දෙනවා. අභිධර්මයේ හැටියට බුදුරජාණන්වහන්සේ මාතෘකා කරුණු දෙනවා සැරියුත් මහ රහතන් වහන්සේට. ඒ බුදුරජාණන්වහන්සේ දුන්නාවූ ඒ මාතිකාවන් වල න්‍යායන්හි පිහිටා උන්වහන්සේ මේ ධර්‍මය විස්තර කරනවා, උන්වහන්සේගේ ගෝල බාලයන්ට. සැරියුත් ස්වාමීන්වහන්සේගේ පරම්පරාවේ - ඒ ඥානවන්ත පරම්පරාවේ පැමිණි උන්වහසේගේ ශ්‍රාවකයෝ - ශිෂ්‍ය - අනුශිෂ්‍ය පරම්පරානුගත ඒ ස්වාමීන්වහන්සේලා තමයි මේ ධර්‍ම න්‍යාය - මේ ක්‍රමය වැඩිපුරම බාර අරගෙන පවත්වාගෙන ආවෙ. එතකොට සූත්‍ර දේශනාවන් පසු කාලීනව විස්තර කරන කොට ඒ විස්තර කරන ක්‍රම ඒ සූත්‍ර දේශනා කරන ස්වාමීන්වහන්සේලා යොදාගත්තා වගේම අභිධර්මය පිළිබඳව විස්තර කරන ඒ ස්වාමීන්වහන්සේලාත් ඒ බුද්ධකාලේ ඉඳල තිබ්ච්ච ක්‍රම හොඳට පරිශීලනය කරගෙන දියුණු කරගෙන ආව. ඒ නිසා මේ අභිධර්මය විස්තර කරන තැන, මේ පට්ඨාන කරුණු හොයන්න ඕන වෙන්නේ පට්ඨානයෙන්. සමහර කොටස් - සූත්‍ර දේශනාවල තිබෙන කොටස් සම්බන්ධ කරලා කියල දෙන තැන් තියෙනවා. ඔක්කොම නෙමෙයි. ඉතින් මේක ගාම්භීර ධර්‍මයක්. සියුම් වූ ධර්‍ම විස්තරයක්. සූක්‍ෂම ධර්‍මස්වභාවයක් ගැන කියන එකක්. මෙහෙම කරන්නේ, අපිට තිබෙන්නාවූ ආත්ම සංඥාව - පුද්ගල සංඥාව අයින්කරගන්ට උපකාරක ධර්‍මයක් හැටියට. මේ ආත්ම සංඥාව අයින්කරනවා කියන එක හරි අමාරුයි. හරී අමාරුයි. හැමවෙලාවෙම ආත්ම දෘෂ්ටිය එනවා. හැම වෙලාවේම සක්කාය දිට්ඨිය එනවා. ඒ ආත්ම දෘෂ්ටිය - පුද්ගල අදහස තියෙන තාක් කල් ධර්‍ම අවබෝධය වෙන්නෙත් නෑ. නිවන් අවබෝධ වෙන්නේ නෑ. සෝවාන් ආදී මාර්ග ඵල වලට පත් වෙන්න පුළුවන් කමක් නෑ. එහෙම වෙන්නේ, ධර්‍මතා ටිකක් - ධර්‍ම සමූහයක් එක්කාසු කරගෙන - පොදු වශයෙන් - මිටි වශයෙන් සහ තනි තනි වශයෙන් ඒවාට අපේ හිත්වලින් කෙලෙස print එකක් - කෙලෙස සම්බන්ධයක් - කෙලෙස අදහසක් අලවල එල්ලලා ගාවල බැඳගෙන තියෙන නිසා. ඒ තමයි ආත්ම සංඥාව. 'මගේ' කියන ගතිය - 'මට අයිතියි' කියන ගතිය. ඒක නිසා මේ ධර්‍ම ටික අතහැරෙන්නේ නෑ. අපෙන් අයින් වෙන්නේ නෑ. අපිව අතහැරලා ඒ ධර්‍ම යන්නෙත් නෑ - අපි ඒ ධර්‍ම අත්හරින්නේත් නෑ. ඒක නිසා, අපි සසරේ කොටුවෙලා. සසරේ කොටුවෙලා සංසාරයේ පැවැත්මේ අතරමං වෙලා අපි ඉන්නේ. ඒ නිසා මේ හේතු ඵල ධර්‍ම රාශියකට හිරවෙලා - එක හේතුවකින් - ඊළඟට ඵලයකින් - හේතුව හදමින් - ඵලය විඳිමින් - ඵලය උපකාර කරගෙන හේතුව විඳිමින් මේ ගමන් කරන - පවතින - මේ හේතු ඵල ධර්‍ම සමූහයේ හිරවෙලා. මේක මහා දුකක හිරවීමක්. කරදරයක හිරවීමක්. මේක මහා විපතක හිරවෙලා විපතම පතන එකක්. මේකෙන් අයින් වෙලා යන්ට මේ ධර්‍ම පුරුදු කරන කොට මේ ධර්‍ම වල සියුම් පැත්තක් අල්ලගෙන කථා කිරීමක් තමයි මේ තියෙන්නේ. විස්තර කිරීමක්

සලකා බැලීමක් තමයි මේ තියෙන්නේ. හැබැයි සූත්‍ර ධර්ම වල, සමහර සූත්‍ර දේශනාවන් ස්කන්ධ වශයෙන් - ආයතන වශයෙන් - ධාතු වශයෙන් - චතුරාර්ය සත්‍ය වශයෙන් බෙදල තියෙන තැන් තියෙනවා එක්තරා ප්‍රමාණයකට. හැබැයි මේ තරම්ම පුංචියට කඩල විස්තර කරන සූත්‍ර දේශනා නෑ. ඒක නිසා සූත්‍රයේ තිබෙන්නාවූ බණයි මේ අභිධර්මයේ විස්තර කෙරෙන බණයි කියල කියන්නේ දෙකක් නෙමෙයි එකම ධර්මය. විස්තර කිරීම් වශයෙන් වෙනත් ආකාරයකට විස්තර කිරීමක්. ඒකත් අපි දැනගන්න එක හොඳයි. නැවත මතක් කර ගන්න එක හොඳයි.

දැන් තව පැත්තකට යන්න ඕනෑ වෙනවා. ඒ තමයි ධර්ම ස්වභාව කොටස් දෙකක් තිබෙනවා. නාම ධර්ම සහ රූප ධර්ම. එතකොට නාම ධර්ම වල තිබෙනවා හිත සහ චෛතසික කියල - අනෙත් එක තමයි සංසාරය සකස් වෙන්නේ චිත්ත - චෛතසික සහ රූප කියන කොටසෙන්. මේ ටිකේ තමයි තියෙන්නේ. මේක ඇවිල්ල බැලුවහම මහ පුදුම විදියට - එකින් එකට මේ ධර්ම එනම් සිත් 89 න් සිත් 81 යි චෛතසික 52 යි රූප ධර්ම 28 යි කියල කියන මේ සමූහය තමයි අපිට කරදර. මේ ධර්ම ටික තමයි අපිට අපේ ජීවිතය හදල තියෙන්න. ඒ ධර්ම ටිකකට තමයි අපි ජීවිතය කියල කියන්නේ. ඒ ධර්ම කියල කියන්නේ, දෙකක් එක සමාන නොවිච්ච බොහොම සියුම් විදියට - ශක්තියක් හැටියට - බලයක් හැටියට - යම් කිසි වේග ස්වරූපයක් හැටියට පවතින්නාවූ ධර්ම - පවතින යම්කිසි ආකාර විශේෂයෝ - ශක්ති විශේෂයෝ - යම්කිසි ධර්ම විශේෂයෝ ටිකක්. මේ ධර්ම විශේෂය - මේ ශක්ති විශේෂයෝ තේරුම් ගන්ටයි කියල - අවබෝධ කරන්ටයි කියල බැසපු තැනත් - ඒ ධර්ම තේරුම්ගන්ට හරවලා - යොමු කරලා තිබෙන හිත් කියන ඒවාත් - ඥානය කියන එක - ප්‍රඥාව කියන එකත් ඇවිල්ල එක්තරා ශක්තියක්. එක්තරා ගුණයක්. එක්තරා ධර්ම ස්වභාවයක්. ඉතින් එහෙම කොටසක් මේ තියෙන්නේ. ශක්ති වල තිබෙනවනේ විවිධත්වයක්. මේ විවිධ ශක්තීන්නේ තියෙන්නේ. ඒවගේ අනිත් එකට බලපාන - අනිත් දේවල් ලඟින් ඉන්න ආකාරයත් වෙනස්. අනිත් ඒවාට බලපාන ස්වරූපයත් වෙනස්. ඒ වෙනස් කම් තමයි අපි මේ වෙලාවේදී පට්ඨානය හරහා කථා කරන්නේ. ඒකෙ එක අවස්ථාවක් අද අපි උදාකර ගන්නවා.

මේක, හරි විස්තර යන එකක්. හැම එක්කෙනාගේම හිත් ටිකක් පරෙස්සන් කරගෙන ඕනෑ මේක ඉස්සරහට ගෙනියන්න. මේක ඇවිල්ල, කසායකට දැම්මොත් මොකක් හරි - අපි හිතමු කසාය වට්ටෝරුවේ තියෙනවා මුල් - පොතු - කොළ - දළු - මල් - ගෙඩි - ඔය වගේ ගත්තයින් පස්සේ සෑම සංකලනයක්ම එක භාජනයකට දැම්මහම - ඒක තැම්බුවහම - පල් කරහම - පාට වශයෙන් ඉදිරිපත් වන ස්වරූපයත් - ගුණ වශයෙන් ඉදිරිපත් වෙන ස්වරූපයත් - ඒවගේම වෙනත් එහෙකින් පාලනය වන ස්වරූපයත් යන මහ ගොඩක් ඕකේ තියෙනවා. අපි ඔය විස්තර කථා කරන්ට යන්නේ නැතුව බෙහෙත කියන වචනය - බෙහෙතේ ගුණය කියන වචනය පමණක් කථා කරලා එතනින් නවත්වනවා. නමුත් එකේ මහා විසාල, තැන් තැන් වලට බලපාන ගතිගුණ සවභාවයක් ඕකේ තියෙනවා. ඒ වගේ කසායක තිබෙන්නාවූ බෙහෙත්වල විවිධ බෙහෙත් ඔවුනොවුන්ට මිශ්‍ර වෙලා ඔවුනොවුන්ට සහගෝගය දක්වමින් වෙනත් ස්වරූපයක් පාටක් අරගෙන ඉන්නව වගේ - මේ ධර්මත් ඔයවගේ. ඒ නිසා අද මේ කථා කරන්නේ ඒ ධර්ම වල එක්තරා තැනක් තව.

අපි කියනවා සිතයි - සිතත් එක්ක හටගන්නාවූ තව ධර්ම තියෙනවා මොනවද? සම්ප්‍රයුක්ත ධර්ම (චෛතසික). සිතයි සම්ප්‍රයුක්ත ධර්ම කියන චෛතසික ධර්මත් තවත් ගුණ විශේෂයෝ ටිකක්නේ. මේවා උපදින්ට මේවා හටගන්ට උපකාර වෙන්නාවූ තව තියෙනවා ධර්ම විශේෂයෝ ටිකක්. සිත් තිබුනයි කියල එකපාරම එහෙම පහළ වෙන්නේ නෑ. ඒකට තව තියෙනවා උපකාරක ධර්ම. උපකාරක ධර්ම තියෙනවා ඇතුලතින් සහ පිටතින්. අරමුණක් නැතුව මේවා පහළ වෙන්නේ නැනේ. දැන් සිත කියන ගුණ විශේෂය චෛතසික කියන ධර්ම ටිකකුත් එක්ක පහළ වෙනවා මතු වෙනවා කියල කියන්නේ ඒකට උදව්වට උපකාරයට - ඒකට අහුවෙන්න - යටත් වෙන අරමුණකුත් ඔය අස්සේ තියෙන්ට ඕන. ගොඩාක් තිබෙනවා ඔය හිතක් පහළ වෙන්ට තිබෙන කරුණු කාරණා. අපි ඒවා එකක් හැටියට කියනවා අරමුණෙයි කියල. ඉතින් මේවාගෙන් සමහර ඒවා තියෙනවා ඇත්තට අතිශයෙන්ම විශේෂ වෙලා තියෙන්ට ඕන. ඒ විශේෂිත ධර්ම වලට කියනවා - ඒක උපකාරකයක් - ඒකට කියනවා 'උපනිශ්‍රය ගුණය' කියල. විශේෂයෙන් ඉදිරිපත් වෙන එකට කියනවා 'උපනිශ්‍රය ගුණය' කියල.

මම නිතරම කියන උපමාවක් තියෙනවා. ඒ උපමාව තමයි තේ එකක් බොනකොට ඒ තේ එකට අත්‍යාවශ්‍ය කරුණු තියෙනවා. වතුර ඕනෑ - තේ ඕනෑ - කෝප්පයක් ඕනෑ - සීනි ඕනෑ - කිරි ඕනෑ තියෙනාවනම්. ඊට පස්සේ කියනවා මේක තේ එකක් කියල. දැන් මේ තේ එකට තේ එකක්යයි කියල බොන්නෙ වතුරනේ. ඒ වතුර ප්‍රමාණයක් තේ එක නමින් බොන්න නම් විශේෂයෙන්ම ඒකට තේ අවශ්‍යයි. බොන්ට වතුර තියෙන්න ඕන - කෝප්පයක් තියෙන්ට ඕන - පීරිසියක් නම් උදව්වට පීරිසියක් තියෙන්ට ඕනෑ - වෙනත් ජාති තියෙනවා වෙන්ට පුළුවන්. දැන් මනුස්සයෝ පාරේ යනවා. අපි යමු තේ එකක් බොන්න කියල යනවා. දැන් එතකොට යන්නේ මොකටද. තේ එකක් බොන්න. කිව්වේ මොකක්ද? තේ එකක් බොනවා කියල. දැන් මේ පාරේ යන මනුස්සයෝ ඒ කඩේ පැත්තට හැරෙව්වේ - ඒ අය ඒ පැත්තට යොමු කරේ 'තේ' එකක්. දැන් තේ එකක් තමයි අරමුණු වුනේ. මෙන්න මේ වගේ ප්‍රධාන, යම් කිසි දෙයක් සිදුවෙන්ට චිත්ත ධර්ම - චෛතසික ධර්ම පහළ වෙන්ට විශේෂයෙන්ම උදව්වෙන විශේෂයෙන්ම උපකාරවෙන ධර්ම තියෙනවා. ඒවා අනිවාර්යෙන්ම තියෙන්ට ඕනෑ. අන්න ඒවාට කියනවා උපනිශ්‍රය ශක්තිය තියෙන - විශේෂ බලයක් - විශේෂ හේතුවීමක් - විශේෂ උපකාරයක් වෙන්නාවූ නැතුවම බැරිව තියෙන්නාවූ ධර්ම කියල. ඒකට කියනවා 'උපනිශ්‍රය ප්‍රත්‍යය' කියල. තේ එකක් හදන්ට තේ නැතුව බැනේ. සීනි නැතුව වෙන්ට පුළුවන්. කිරි නැතුව වෙන්ට පුළුවන්. ඒවගේම වෙනත් දේවල් නැතිවෙන්ට පුළුවන් හැබැයි තේ එකක් හදන්ට තේ නැතුව බෑ. තේ තියෙන්ටම ඕනේ.

ඒ වගේම ඔය දහම් පොත පතේ තියෙනවා හොඳ ලස්සන උපමා දක්වල. අපේ පැරණි ස්වාමීන්වහන්සේලා. අපි හිතමු මෙහෙම. ගිය වතාවල අපි කථාකළා 'නිශ්‍රය' කියන එක - නිශ්‍රය ප්‍රත්‍යය. දැන් යම් කිසි දෙයක් සිදුවෙන්ට යම් කිසි චිත්ත චෛතසික ධර්ම පහළ වෙන්ට උපකාරක ධර්ම. අනිත් එක තමයි භූමි ගත වෙන්නාවූ ධර්ම. දැන් මෙතන තිබෙන්නේ විශේෂයෙන් උපකාර වෙන්නාවූ ගතිය. ඒක නැතුවම බැරි ධර්මයක්. අපි අහල තියෙනවා දුටුගැමුණු රජතුමා රුවන්වැලිසෑය හැදුවය කියල. දැන් එහෙමනේ පොත පතේ තියෙන්නේ - රුවන්වැලිසෑය හැදුවේ කවුද? දුටුගැමුණු රජ්ජුරුවෝ. හැබැයි දුටු ගැමුණු රජ්ජුරුවෝ ඒක හදන්නේ තමන්ම නෙමෙයි. ඒකට අවශ්‍ය මේසන්ලා - අලි - ඇත්තු - සේවකයෝ -

රටවැසියෝ ආදී  විසාල පිරිසක් එක්කාසු කරගෙන - ඒ අයගේ ශ්‍රද්ධාවෙන් ඉදිරිපත් වීමයි ඊළඟට කුලිය දීල ඉදිරිපත් කරගැනීමයි - උපදෙස් ගැනීමයි -  ඊළඟට ඒවාගේ මුල් දේවල් හදන්නේ කොහොමද කියල ඒ දැනුම තියෙන අයගෙන් උපදෙස් ලබා ගැනීමයි  ඔය ඔක්කොම ටික එකතු කරගෙන රුවන්වැලිසෑය හැදුවත් වතුර - ගඩොල් වගේ ගොඩාක් තියෙනවා අවශ්‍ය කරන දේවල්. හැබැයි මේ අවශ්‍ය කරන දේවල් - පස් - වැලි - ඇත්තු - සේවක සේවිකාවෝ ඔක්කොම තියෙනවා. ඒ ඔක්කොම තිබුනත් ඒ රජතුමාගේ ඉදිරිපත් වීමක් නැතුව රජ තුමා අණ කරන්නේ නැතුව පඩි නඩි දෙන්නේ නැතුව අරව කෙරෙන්නේ නෑ. ඒක නිසා ප්‍රධාන හේතුව තමයි - ප්‍රධාන කාරණය තමයි දුටුගැමුණු රජතුමා.

දැන් ඕකේ තියෙනවා මෙහෙම. අලි දාල පෑගෙව්වා කියනවනේ ඔය  මැටි එහෙම. අලි ලවා අද්දෙව්වලු - අලි දාල පාගවල තියෙනවා මැටි එහෙම. ඉතින් ඒ අවස්ථාවේදී සේවක සේවිකාවන්ගෙන් එක්කෙනක් දෙන්නෙක් අඩු උනත් මොකක්හරි කරලා කරන්න පුළුවන්. නමුත් රජතුමාගේ ඉදිරිපත් වීම නැති උනොත් අනිත් අය කොහොම හිටියත් කොච්චර ගඩොල් තිබුනත් ඒක හදන්න බෑ. ඒක නිසා ප්‍රධාන හේතුවක් අවශ්‍යයි. ප්‍රධාන යොමු කිරීමක් අවශ්‍යයි. දැන් බලන්න පාසලක් ගත්තම ඒ පාසැල නියම විදියට පවත්වාගෙන යන්ට ළමයි එන එක එකක්. ගුරුවරු එන එක එකක්. හැබැයි විදුහල්පති වරයෙක් ඉන්න ඕනෑ ඒ පාසැල යම්කිසි රටාවකට ක්‍රමානුකූලව පවත්වාගෙන යන්ට. ඒවගේම තමයි අනිත් ඔය අධාර වෙන ගොඩනැගිලි එහෙම අවශ්‍යයි තමයි. ගොඩනැගිලි තිබුනටම ඒක කරන්න බෑ. ප්‍රධාන කාරණයක් අවශ්‍යයි. ඒවගේ උපනිශ්‍රය ප්‍රත්‍යය වෙනවා කියල කියන්නේ චිත්ත ධර්ම - චෛතසික ධර්ම හටගැනීමට - පහළ වීමට - ඒවා ක්‍රියාත්මක වීමට හේතු වෙන්නාවූ ඉතාමත්ම බලවත්,  'නැතුවම බෑ' කියන්න වගේ  පවතින විශේෂිත ශක්තියක්. විශේෂිත කාරණයක්. ආන්න ඒකට කියනවා මොක්කක්ද? උපනිශ්‍රය ශක්තිය තියෙන 'උපනිශ්‍රය ප්‍රත්‍යය' කියල. ප්‍රධාන කාරණය - ප්‍රධාන උපකාරක ධර්මය.

මේ උපනිශ්‍රය ධර්ම කථාකරන කොට කරුණු 'තුනක්' තියෙනවා. අපි ඒ කරුණු තුන පරෙස්සමෙන් ගමු. දැන් අද කථාකරන්නේ මොකක්ද? උපනිශ්‍රය ශක්තිය. මොකක්ද උපනිශ්‍රය කියල කියන්නේ? ප්‍රධානවම තවත් දේකට  උදව් වෙන උපකාරවෙන  ශක්තිය - ගුණය. විශේෂයෙන්ම දැන් අපේ මේ හිත් පහළ වෙනවනේ - අපේ හිතක් පහළ වෙනකොට - ඒ හිතත් චෛතසිකත් පහළ වෙන්ට විශේෂයෙන් උපකාර වෙන්නාවූ දේවල් තියෙනවා - අන්න ඒවා තමයි. විශේෂයෙන් උදව් වෙන උපකාර වෙන දෙයක් නිසා මේ චිත්ත චෛතසික ධර්ම පහළ වෙනවා. මේ චිත්ත චෛතසික ධර්ම වලට කියනවා ප්‍රත්‍යයෙන් හටගන්න ප්‍රත්‍යය උප්පන්න  ධර්ම කියලා. හැබැයි ඒ ප්‍රත්‍යය උප්පන්න ධර්ම හටගන්ට ප්‍රත්‍යය වෙන්නාවූ - උදව්වෙන්නාවූ - විශේෂිත උපකාරවෙන ධර්ම වලට කියනවා උපනිශ්‍රය  ධර්ම කියල. ඒ ධර්ම වල තිබෙනවා කරුණු තුනක්.

- එකක් තමයි අපේ හිත්  හට ගැනීමට චෛතසික පහළ වීමට අරමුණු බලපානවා. සමහර අරමුණු තියෙනවා හරි ප්‍රධානයි. ප්‍රධාන අරමුණු තියෙනවා. අරමුණක් ප්‍රධාන වෙලා එනකොට -  ඒ කියන්නේ නා නා ප්‍රකාර අරමුණු තියෙනවනේ. ලොකු අරමුණු තියෙනවා - මධ්‍යම ඒවා තියෙනවා - පොඩි අරමුණු තියෙනවා -  විසාල ඒවා තියෙනවා - ඒ තරමම සැලකිල්ලක් නැති අරමුණු තියෙනවා. ඔය වගේ අරමුණු

තියෙනවා මහ ගොඩක්. ලොකු - පොඩි - ගරු - සුළුකොට තකන දේවල් වශයෙන්. ඒ අරමුණු අස්සේ තියෙනවා ලොකුවට ලොකුවට ලොකුවට සලකන මහා බලවත් අරමුණු තියෙනවා. ආන්න ඒවා ආවයින් පස්සේ ඒ බලවත් අරමුණු නිසා දිගට දිගට දිගට ඒ අරමුණ සම්බන්ධයෙන් සිත් පහළ වෙනවා. චෛතසික ධර්ම පහළ වෙනවා. ආන්න ඒ අරමුණක් බලවත් නිසා චිත්ත චෛතසිකන් ධර්මයන් පහළ වීමට හේතුවෙන එකට කියනවා 'අරමුණු විශේෂයෙන් ප්‍රත්‍යය වෙනවා' – ' අරමුණු විශේෂයෙන් උපකාර වෙන ගුණය කියල' ඒකට කියනවා 'ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යය කියල. අරමුණක් බලවත් ශක්තියක් ප්‍රත්‍යයක් හැටියට හේතුවෙනවා.

- තව එකක් තියෙනවා. ඒ තමයි - දැන් මේ අපේ හිත් පහළවෙන කොට හිත් පහළ වෙන්නේ ඉස්සර වෙලා තිබ්ච්ච හිතකට පස්සේ. ඉස්සර වෙලා හිතක් තියෙන්ට ඕන පස්සේ එකක් පහළ වෙන්ට. එහෙම අපූ පේළියක් නැත්නම් - දැන් මෙහෙම බලන්න 1,2,3,4,5,6,7,8,9,10,11 කියලා ඔහොම කියාගෙන යනකොට 11,12,13,14 කියල කියන කොට හැමවෙලාවෙම - (උදාහරණයක් හැටියට මේ) හැමවෙලාවෙම ඉසෙල්ලා තිබෙන්නාවූ සංඛ්‍යාව ඊළඟ සංඛ්‍යාව මතුකරන්ට ගැම්මක් දෙනවා. පාඩම් කරගත්ත කථාව එකක්. මේක උදාහරණයක්. අපි සංකල්ප දීල තියෙනවා මේ නොම්බරේ කියල. නමුත් 14 කියන්ට නම් 13 කියන එක තියෙන්ට ඕනේ. 13 වැටෙන්ට 12 කියන එක තියෙන්ටම ඕනේ. 12 වැටෙන්ට 11 කියන එක තියෙන්ට ඕනේ. ඒවගේම සිත්වලත් තිබෙනවා ඉස්සර වෙලා ඉස්සර වෙලා පහළ වුනු - ඒ කලින් කලින් පහළ වෙච්ච ඒ සිතක - පේළියක - කෙළවරක් තියෙන්ට ඕනේ. ඒකට පස්සේ තමයි අනිත් එක - ඒකට පස්සේ තමයි අනිත් එක. දැන් මේක නොවෙන්ට අපි සංසාරේ කොහේ හෝ වේවා ආරම්භයක් පටන් ගත්තු තැන දිගටම ඇවිල්ල ඇවිල්ල ඇවිල්ල දැන් 'හිත්නේ' ඇවිල්ල තියෙන්නේ, චිත්ත චෛතසික - චිත්ත චෛතසික එක්ක ඔය විදියට ගැට ගැහී - ගැට ගැහී - එක එක හිතක් ගානේ දිගටම ඇවිල්ල ඉන්නවා. දැන් අපේ මේ දැනට තිබෙන බණ අහන වෙලාවේ තිබෙන මේ හිත එහෙම නැත්නම් මේ පහළ වෙන අවසාන - මේ තත්පරයේ මේ හිත - ආපස්සට ගියැන් පස්සේ මහා සිත් වැලක්. සංසාරේ ඈතට මේ සිත් පේළිය යනවා. නමුත් ඒ ආපු පේළියේ අවසාන කොනක් - කෙළවරක් තියෙන හින්ද - ඒ හිත නිසා තමයි ඊළඟ එකක් පහළ වෙන්නේ. එහෙම නැතුව අලුතින් හිතක් පහළ වෙන්නේ නෑ. 'දැන් ඉස්ඉස්සෙල්ලාම මේ හිතක් පහළ වෙනවා' – 'මේ තමයි අලුත් හිත' – 'මීට ඉස්සෙල්ල තිබුනේ නෑ හිතක් කොහොමවත්ම' කියල එහෙම නෙමෙයි. පසුව පසුව පහළ වෙන හිතට පෙර පහළ වෙච්ච හිතක සම්බන්ධයක් තියෙන්න ඕන. එහෙම අමුතු විදියේ සම්බන්ධයක් මේකේ තියෙනවා. හැමවෙලාවෙම සිතක් පහළ වෙන්නේ අවසානයට තිබෙන හිතේ කෙලවරේ. ආන්න ඒ අලුතින් සිතක් පහළ වෙන්ට ඒ සිතේ චෛතසික පහළ වෙන්ට ඒ එක්කම කලින් තිබ්ච්ච හිතක් තියෙනවනේ අවසාන වී යන කෙලවරේ කොනේ. ආන්න ඒ හිතට කියනවා අනන්තර සවභාවය කියල. ඒක නැත්නම් ඊළඟට අලුතින් පහළ වෙන හිත නෑ. ඒකට කියනවා 'අනන්තර උපනිශ්‍රය' ස්වභාවය කියල.

දැන් බලන්ට 'ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යය' සහ 'අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යය' උපනිශ්‍රය කීයක් තියෙනවද? දැන් දෙකයි. උපනිශ්‍රය ප්‍රත්‍යය කියල කියන්නේ විශේෂයෙන්ම චිත්ත චෛතසික හටගන්ට හැදෙන්ට බලපාන විශේෂ කාරණා කියන එක. ඒක උපනිශ්‍රය. හැබැයි ඒක උපනිශ්‍රය වෙන තැන් 3 ක් තියෙනවා. එකක් තමයි අරමුණ උපනිශ්‍රය වෙනවා - ඊළඟට කලින් පහළ වෙච්ච හිත අනන්තර උපනිශ්‍රය වෙනවා.

තව එකක් තියෙනවා. ඒක ඇවිල්ල විශේෂිත මනෝමය ධර්ම. ඒකට කියනවා කුසල් ධර්ම සහ අකුසල් ධර්ම කියල. ඒකට කියනවා 'ප්‍රකෘතියෙන්ම උපනිශ්‍රය වෙන ස්වභාවය' කියල.

දැන් කරුණු තුනක් වෙනවා.

- ආරම්මණ උපනිශ්‍රය
- අනන්තර උපනිශ්‍රය
- ප්‍රකෘති උපනිශ්‍රය කියල උපනිශ්‍රය වෙන විශේෂයෙන් බලපෑම් කරන විශේෂයෙන් හේතු භූත වෙන ස්වභාව 3 ක් තියෙනවා.

අපි කිව්වනේ ඉස්සරවෙලා අර අනුරාධපුරේ කථාවක්. ඒක ගැන හිතන්ටකෝ බලන්න නැවතත්. දැන් අපි අනුරාධපුරේ වදින්ට යනවනම් අනුරාධපුර රුවන්වැලිසෑය වදින්ට යනකොට ඒ රුවන්වැලිසෑය නිසා අපි කොච්චර ක්‍රියාවල් කරනවද? ඒ වන්දනා ගමනට යනකොට ඒ වන්දනා ගමන රුවන්වැලිසෑය නිමිති කරගෙන කොච්චර නම් සිත් පහළ කරනවද. වාහනයක් හොයාගන්න ඕනෑ. ඒ වාහනය හොයාගන්නෙ රුවන්වැලිසෑය අරමුණු කරලනේ. කෑම හදාගන්ට ඕනෑ - කෑම හදන්නේ රුවන්වැලිසෑය වැඳීමට යන ගමනටනේ. ඊළඟට ඇඳුම් පැළඳුම් ගන්ට ඕනෑ. පිරිසට කථා කරන්ට ඕනෑ. කඩේට යන්න ඕනෑ. දැන් මේ සෑම සිතුවිල්ලක්ම සෑම කායික ක්‍රියාවක්ම සෑම චෛතසිකයක්ම මේ සම්බන්ධයෙන් කරන ඔක්කොම ටික මොකක් අරමුණු කරගෙනද මුල් වෙලාද කෙරෙන්නේ - අර රුවන්වැලිසෑය අරමුණු කරගෙනයි. ඊළඟට පාරේ ගමන් කරනවා - මිනිස්සු හම්බවෙනවා - කථා කරනවා - කොහෙද යන්නේ අහනවා - 'අනුරාධපුරේ යනවා' කියනවා. ඉතින් රුවන්වැලිසෑය මුල් කරගෙන කොච්චර චිත්ත චෛතසික පහළ වෙනවද. ආන්න එහෙම බැලුවම මේක ප්‍රධාන අරමුණක්. ඒක නිසා කියනවා ආරම්මණ වශයෙන් මේක චිත්ත චෛතසික පහළ කරන්ට මහා විසාල පිටුවහලක් උපකාරයක් ලොකු අරමුණක් වෙනවා.

දැන් තව එකක් තියෙනවා. ඒකට තියෙනවා අරමුණ ලොකුවට සලකන දෙයක් වෙන්ට ඕන. දැන් සුනාමිය බලන්න. සුනාමිය කියන කාරණය නිසා ලෝකයේ කී දාහකගේ ලක්ෂ කීයකගේ හිත්වල ඒ සුනාමිය අරමුණු කරන සිත් පහළ උනාද. ඊළඟට සුනාමිය කියන ඒ ස්වභාවය නිසා කී දෙනෙක් දුක් උනාද - කී දෙනෙක් ඇඬුවද - සුනාමිය ගැන කොච්චර කථාකරාද - කොච්චර ප්‍රවෘති ලිව්වද - කොච්චර ප්‍රවෘති කියෙව්වද - විසාල සිත් ටිකක් ලෝකය වටේම ඇති උනානේ. දැන් මොකක්ද ඒ? ඒකට කියනවා ඒ සිත් පහළ වෙන්ට රජතුමාගේ ඉඳල පාරේ යන්නවූ හිඟන්නා දක්වා හැම එක්කෙනාගේම හිත්වල තිරිසන් ගත සතුන්ගේ පවා හිත්වල සිත් පහළ වෙන්ට චෛතසික මතුවෙන්ට හේතුවෙච්ච විසාල අරමුණක් තමයි සුනාමිය. ඒ සුනාමිය නිසා ඒ හිත් පහළ උනා. ඒ පහළ වෙච්ච සිත් ඇවිල්ල ප්‍රත්‍යය උප්පන්න ධර්ම. උපනිශ්‍රය ප්‍රත්‍යය නිසා හටගත්ත ධර්ම. ඊළඟට ඒ සුනාමිය තමයි

උපනිශ්‍රය ප්‍රත්‍යය. ඒ උපනිශ්‍රය මොකක් වශයෙන්ද ආරම්මණයක් හැටියට ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යය. ඔන්න එකක්.

ඊළඟට අපි හිතමු මෙහෙම. ලෝකේ මිනිස්සු හැමදාම ඇමරිකාව ගැන කථා කරනවා. ඇමරිකාව ගැන හිතනවා. ලොකු රටක් - ප්‍රසිද්ධ රටක් - බලවත් රටක්. ඉතින් කට්ටිය විශාල වශයෙන් කථා කරනවා - හිතනවා - යන්න ඕන කියල හිතනවා. ඒ කුමක් නිසාද? ඒක ලොකුවට හිතාගත්ත ලොකුවට අරමුණු කරන අරමුණක් ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යය. චීන රට බලන්න. ඒකත් ඒවගේ. ඒ විතරක් නොවෙයි. දැන් බලන්න ඔය ඉර හඳ  වස්තු. ඉර හඳ නිසා මිනුස්සු කොච්චර හිත පහළ කර ගන්නවද? කොච්චර හිත පහළ වෙනවද? කොච්චර චෛතසික පහළ වෙනවද? ඒවා ඇවිල්ල ආරම්මණ වශයෙන් උපනිශ්‍රය ප්‍රත්‍යය = ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යය. එතකොට ඔය විදියට තමයි උපනිශ්‍රය ප්‍රත්‍යය නිසා අපේ හිත්වල පහළ වෙන ඒ ඒ චෛතසික ධර්‍ම අපි තේරුම් ගන්නේ.

දෙවෙනි කාරණය තේරුම් ගනිමු. ඒකට කියනවා අනන්තර වශයෙන් උපනිශ්‍රය වෙනවයි කියල. ඒක අමාරු නෑ මම හිතන හැටියට තේරුම් ගන්න. අනන්තර ප්‍රත්‍යය අපි මීට ඉස්සර කියල තියෙනවා. හේතුව ඒ වගේමයි අනන්තර ශක්තිය. ඒකෙ තිබෙන්නේ විශේෂයෙන්ම රහතන් වහන්සේ නමක් පිරිනිවන්පාන කොටයි ඒ හිත අවසානයේදී නතර වෙලා යනවා. වැඩ කරන්නේ නැතුව යනවා. නිවනට ගියාට පස්සේ හිත් පහළ වෙන්නේ නෑ. චෛතසිකත් නෑ. රූපත් කොහෙත්ම නෑ. එතකොට මේ  අවසාන හිත ඒ කියන්නේ චුති සිත - රහතන් වහන්සේගේ චුති සිත ඇවිල්ල අනන්තර ස්වභාවයක් නැති හිත. ඒකෙන් පස්සේ කිසිම හිතක් පහළ වෙන්නේ නෑ. රහතන් වහන්සේගේ අවසාන පිරිනිවන් පාන වෙලාවේ පහළ වෙන චුතිචරිමකය කියල කියන චුති සිතට විතරයි නැවත ඊට පස්සේ සිතක් පහළ වෙන්ට - පහළ කරන්ට ‘උපනිශ්‍රය’ හරි ‘නිශ්‍රය’ හරි වෙන්ට බැරි. ඒවගේම ‘අන්නතර භාවයකුත්’ නෑ ඒකෙ. ඊට කලින් ඒවාට තියෙනවා. රහතන් වහන්සේගේ චුති සිතට කලින් සිතක් පහළ වෙනවනේ. ඒ අවසාන හිතට කලින් සිතෙත් තිබෙනවා අනන්තර ස්වභාවය. ඒ කියන්නේ කලින් හිත හින්ද  ඊළඟ හිත  කියන එක. හැබැයි චුති සිතට නෑ. ඒ දක්වා මෙහා පැත්තේ හැම හිතකම අග්ගිස්සෙන් අග්ගිස්සෙන් හිත් පහළ වෙලා යනවා. ඒකට කියනවා ‘අනන්තර උපනිශ්‍රය ස්වභාවය’ කියල.  හිත් වල ආපු කෙළවරක් තියෙන්න ඕන. පරම්පරාවක යම්කිසි ඇදියක් තියෙන්ට ඕනෑ. ආපු විදියක් තියෙන්ට ඕනෑ. එහෙම නැතුව පස්සේ පස්සේ සිත් පහළ වෙන්නේ නෑ. දැන් ඒ පරම්පරාවෙන් දිගට ආපු හිත්වැලක් තියෙන්නේ. අපේ නාම  ධර්‍ම කියල සිත් වැලක් තියෙන්නේ. ඒ සිත් වල මේ  මොහෙතේ ඉඳන් ආපස්සට හිතාගෙන ගියහම පංච ද්වාරික සිත් පාස් කරගෙන ගියා - මනෝද්වාරික සිත් පාස් කරගෙන  ගියා - භවාංග සිත් පාස් කරගෙන පාස් කරගෙන  ගියැන් පස්සේ තව මැද තියෙනවා ඔය යනකොට පංච ද්වාරික සිත් හරහා - මනෝ ද්වාරික සිත් හරහා - කායික ක්‍රියාවන් හරහා - භවාංග සිත් හරහා ආපස්සට ආපස්සට ගියැන් පස්සේ ඒවා ඔක්කෝම  පංච ද්වාරික ආවර්ජන සිත් වශයෙන් හරි එහෙම නැත්නම් චිත්ත වීථි වශයෙන් හරි භවාංග සිත් වශයෙන් හරි ප්‍රතිසන්ධි වශයෙන් හරි ගියැන් පස්සේ - පිටි පස්සට පිටි පස්සට ඈතට ගියාට පස්සේ තියෙන්නේ සිත් line එකක් - සිත් පේළියක් දිගටම ඒ විදියට ඇවිල්ල තිබෙනවා. මේ අපි ජීවත්වෙනවා කියල කරලා තියෙන්නෙත් සිත් පවත්වන එක. සිත් පවත්වා ගන්ට උපකාරක රූප හදන එක. සිත් පවත්වන එක තමයි ජීවත් වෙනවා කියන්නේ.   මේක අතීතයට ගියැන් පස්සේ අනන්තර

ප්‍රත්‍යය වෙලා වෙලා වෙලා ගොඩක් ඈතට තියෙනවා. දැන් අපි කෙළවරක ඉන්නේ. මේ පවත්වන හිත් පරම්පරාව යම්කිසි වෙලාවක අපි නවත්වනවා. නැවත්වුයින් පස්සේ ඒකට කියනවා 'නිරෝධය කරනවා' ඒ තමයි අර අනන්තර ස්වභාවය නැතිකරලා දානවා. ඉස්සරහට හැදෙන්න දෙන්නේ නැහැ. කොහොම හරි, මෙතන 'අනන්තර උපනිශ්‍රය ස්වභාවය' කියන්නේ ඉස්සරවෙලා හිතක තිබෙන බලවත්ම හේතුව - උපකාරක ස්වභාවය - link කරන ගතිය පස්සේ සිතක් පහළ වෙන්න. ඒකට කියනවා අනන්තර උපනිශ්‍රය ස්වභාවය කියල. දැන් උපනිශ්‍රය කීයක් කිව්වද? උපනිශ්‍රය ස්වභාව දෙකක් කිව්වා. ආරම්මණයක් හැටියට ලොකුවට ගිහිල්ලා හිත් පහළ කරන උපනිශ්‍රය ස්වභාවය - ඊළඟට කලින් පහළ වෙච්ච හිතක් නිසා දැන් අනන්තර භාවයෙන් ඇවිල්ල උපකාරවෙලා හිත පහළ වීම.

තව කාරණයක් තියෙනවා. ඒකට කියනවා ප්‍රකෘති උපනිශ්‍රය කියල = (පකති උපනිශ්‍රය). ඒක ඇවිල්ල කුසල හෝ අකුසල හෝ වශයෙන් පහළවෙන ධර්ම ටිකක් තියෙනවා. දැන් බලන්න මෙහෙම - ඒකට උදාහරණයකුත් දාල තියෙනවා. ඒක පොදු උදාහරණයක්. ඒ කියන්නේ කෙලෙස් සහගත උදාහරණයක්. යම් කිසි පුරුෂයෙක් ලස්සන කාන්තාවක් දකිනවා. ලස්සන කාන්තාවක් දැක්කම ඒ පුරුෂයාගේ හිතේ ලෝභ සිතක් - රාග සිතක් - තණ්හා සිතක් පහළ වෙනවා. දැන් ඒ තණ්හාව එහෙම නැත්නම් ඒ රාගය නැත්නම් ඒ ලෝභය ඉස්සරවෙලා හට ගන්නවා අර කාන්තාව අරමුණු කරගෙන. ඒ හටගත්තයින් පස්සේ ඒ පළවෙනි හිතේ තිබ්ච්ච ඒ රාගය නිසා ඒ රාග හිත නිසා හරි ලේසියෙන් පස්සේ තව තව රාග සිත් - ලෝභ සිත් - ඇලුම් කරන සිත් තව තව දිගට දිගට දිගට පහළ වෙලා යනවා. දැන් බලන්ට ඒ පස්සේ පස්සේ හිත ටිකට ඉබේ පහළ වෙන්ට - ලේසියෙන් එන්ට විශේෂයෙන් උදව් උනේ උපකාර උනේ මොකක්ද? අර රාගය. දැන් මේ විදියට හිතන්න බලන්න. තමන්ට අහිත අවැඩ ඒවගේම හතුරෙක් වගේ අප්පිරිය කරන මනුස්සයෙක් ඉන්නවා. ඔන්න ඉස්සරවෙලා තරහ සිතක් පහළ වෙනවා. ඒ තරහ සිත පහළ උනාට පස්සේ ඒ තරහ සිත නිසා දිගට දිගට - දිගට දිගට තව ගොඩක් සිතුවිලි පහළ වෙනවා. දැන් බලන්ට මේ පස්සේ පහළ වෙන සිත්වලට ඒ සිත් පහළ වෙන්ට අනුකරලා දුන්නේ මොකක්ද? තරහ. ඊළඟට අර කාන්තාව කෙරෙහි ලෝභය රාගය උපදවන්ට තණ්හාව ඇතිකරන්ට ඇතිඋනේ මොකක්ද? අර ඉස්සෙල්ල ඇතිවෙච්ච ලෝභ සිත. ආන්න ඒක නිසා මේ ධර්ම වලට කියනවා ප්‍රකෘතියෙන්ම ස්වභාවයෙන්ම අනිත් ඒවාට හේතුවන නිසා නැත්නම් උපනිශ්‍රය වෙන නිසා ඒකට කියනවා 'ප්‍රකෘති උපනිශ්‍රය ප්‍රත්‍යය' කියල.

දැන් තවත් එකක් ඔකේ දක්වනවා මෙහෙම. අකුසල් විතරක් නෙමෙයි. කුසලුත් එනවා. දැන් ඔය සමහර වෙලාවට දඹදිව ගිහිල්ලා ආවට පස්සේ කෙනෙක් ඔය දඹදිව වැඳපු තාලේ - කොඩි එල්ලපු තාලේ - පහන් දල්ලවපු තාලේ - බණ අහපු තාලේ - පිරිත් අහපු තාලේ ඔය විදිය කියනවනේ. ඒ කියනවා කියල කියන්නේ ඒ පිරිත් - බණ - බෝධි පූජා - වන්දනා ආදී වශයෙන් ඒවා ගැන හිත පහළ කිරීමක්නේ. ඒ අලුතෙන් අලුතෙන් පහළ කර කර අර ශ්‍රද්ධාව ඇතිකර කර කියනවනේ. ආන්න එතකොට ඒ ශ්‍රද්ධාව කියන එක පස්සේ පස්සේ සිතුවිලි දක්වන්ට - මතුකරන්ට - පහළ කරන්ට - හදන්ට - චෛතසික හදන්ට විශේෂයෙන්ම උදව් උනානේ - උපකාර උනානේ. ආන්න ඒ උපකාරක උදව්වෙන ගතියට කියනවා ප්‍රකෘති වශයෙන් උපනිශ්‍රය වෙනවයි කියල - (ප්‍රකෘති උපනිශ්‍රය ප්‍රත්‍යය) ඒක දෘෂ්ටියක් වශයෙනුත්

එහෙමයි. ඒක නිසා මේ ප්‍රකෘති උපනිශ්‍රය ප්‍රත්‍යය හැටියට ගණන් ගන්නේ මේවා. රාගය - ලෝභය - ද්වේශය - ඊර්ෂ්‍යාව - තරහව - මාන්නය - දෘෂ්ටිය - විචිකිච්ඡා ...තව ගොඩක් තියෙනව ඕකට. මේවා නිසා පස්සේ පස්සේ මහා විසාල සිතුවිලි පහළ වෙනවා. ඒකට කියනවා ප්‍රකෘතියෙන් සිතුවිලි පහළ කරන විශේෂ උපනිශ්‍රය ධර්මය කියල. ශ්‍රද්ධාව තියෙනවා - ප්‍රඥාව තියෙනවා - අපි කුසල ධර්මයක් ඉස්සෙල්ල වැඩුවත් කුසල ධර්මයක් ඉස්සෙල්ල වෙලා ඇතිවෙලා මෙනෙහි කරහම ඒ හරහා දිගට දිගට මේ සිත් පහළ වෙන නිසා ඒකට කියනවා ප්‍රකෘති වශයෙන් කුසල පැත්තෙන් උපනිශ්‍රය වෙනවා කියල.

දැන් මේකේ තව එකක් තියෙනවා. මොනවද උපනිශ්‍රය ලබාගෙන ඇතිවෙන ප්‍රත්‍යය උප්පන්න ධර්ම. මොකක්ද ප්‍රත්‍යය උප්පන්න කියල කියන්නේ? ප්‍රත්‍යය උප්පන්න කියල කියන්නේ, උපනිශ්‍රය කියල කියන්නෙ විශේෂ උපකාරය. විශේෂ උපකාරයක් තියෙනවා. විශේෂ උපකාරය ලබාගන්න තැනකුත් තියෙනවා. අර තියෙන්නේ විශේෂ උපකාරයනේ. දැන් මේ උපකාරය ලබාගෙන නැගිටින කොටසක් ඉන්නවනේ. ආන්න ඒ ශක්ති ටික තමයි චිත්ත චෛතසික ධර්ම. චිත්ත ධර්ම සහ චෛතසික ධර්ම තමයි අර විශේෂ ප්‍රත්‍යය විශේෂ උපකාරය ලබන කට්ටිය. ඒ විශේෂ උපකාරයෙන් නැගිටින කට්ටිය - ඒ විශේෂ උපකාරයෙන් ගොඩවෙන මතුවෙන ධර්ම තමයි ඔය චිත්ත චෛතසික ධර්ම. ඒ චිත්ත චෛතසික ධර්මයන්ට හේතු වන්නාවූ ඊළඟට ඒවා පහළ වෙන්ට උපකාර වන්නාවූ තවත් තියෙනවා රූප - චෛතසික ධර්ම - කෙලෙස් ධර්ම - ලොකු ලොකුවට සලකන ප්‍රඥප්ති - ඊට පස්සේ ඔය සිත්. ඒවාගේ අස්සේ තමයි ඔය ප්‍රත්‍යය ගතිය තිබෙන්නේ.

ඊළඟට තවත් එක කාරණයක් තියෙනවා ඒක අපි පස්සේ වෙලාවක කථා කරමු. දැන් මම කරුණු තුනක් මතක් කරා එක මාතෘකාවක් යටතේ. අපේ පින්වතුන් යම්කිසි අනාගතයේ දවසක ඔය පට්ඨානය සජ්ඣායනා කරනවා. ඒක අනිවාර්යෙන්ම සිද්ධවෙනවා. පට්ඨානය සජ්ඣායනා කරන කොට යම්කිසි තැනක මේ පින්වතුන් පට්ඨානය සජ්ඣායනා කරනවා උපනිශ්‍රය ප්‍රත්‍යය යටතේ. ඒක අපේ පින්වතුන් ඉගෙන ගන්න එකත් හොඳයි. මේ ධර්ම සමූහයක් කියන්නේ.

**'උපනිස්සයපච්චයොති'** = 'උපනිස්සයපච්චයොති යනු'

**'පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං'** = 'පළමුවෙන් පළමුවෙන් - කලින් කලින් පහළ වෙච්ච කුසල ධර්මයෝ පසුව පසුව පහළ වෙන්නාවූ මතුවෙන්නාවූ කුසල ධර්මයන්ට'

**'උපනිස්සයපච්චයෙන පච්චයො'** = 'විශේෂ උපකාරක ධර්මයක් වශයෙන් උපකාර වෙනවා ප්‍රත්‍යය වෙනවා' කියන එකයි ඒකෙ තේරුම.

කලින් කලින් පහළ වූ කුසල ධර්මයෝ පසුව පසුව පහළ වන්නාවූ අකුසල ධර්මයන්ටත් විශේෂයෙන් උපකාර වෙනවා. ඒක නිසා ඒ ධර්ම කාණ්ඩය යම්කිසි දවසක සජ්ඣායනා කරන්ට ලැබුනොත් මේ පින්වතුන්ට මේවගෙන් කියන්නේ මොනවාද - මේවාගෙන් කියවෙන්නේ මොන ධර්ම කාණ්ඩද - මොන ශක්තිද -මොන ගුණද කියල දැනුමක් තේරුමක්

වැටහීමක් - හිතේ ඒ පැත්තට අවධි වීමක් අවශ්‍යයි. ඒ නිසා මේ පින්වතුන්ට මම මේ මතක් කරේ ඒ කලින් පහළ වෙලා පසුව පහළවෙන කුසල හෝ අකුසල හෝ අව්‍යාකෘත හෝ චේවා ධර්ම වලට විශේෂ ශක්තියක් ගෙන දෙන්නාවූ ධර්ම කණ්ඩයක් පිළිබඳව. මම හිතනවා ඉස්සරවෙලා අපි කිව්වා නිශ්‍රය ප්‍රත්‍යය පිළිබඳව. ඒ නිශ්‍රය ප්‍රත්‍යයයි උපනිශ්‍රය ප්‍රත්‍යයයි එක සමාන වගේ.

ඒකෙ තියෙන්නේ ඔය නිශ්‍රය ප්‍රත්‍යය ගැන කියන කොට අපි මතක ඇති **'චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං නිස්සයපච්චයෙන. පච්චයො'** කියල ඒ විදියට කිව්වනේ. දැන් මෙතන පාවිච්චි කරන්නේ වෙන වචන **'පුරිමා පුරිමා කුසලා ධම්මා'** ඒ විදියටයි. මේ මුලින් කියපු එකේ තිබෙන්නාවූ උපකාරක ස්වභාවයයි උපනිශ්‍රය ප්‍රත්‍යයෙහි තිබෙන්නාවූ විශේෂිත උපකාරක ස්වභාවයයි කියල කියන්නේ ටිකක් ලඟින් තේරුම් ගන්න පුළුවන් ධර්මස්වභාවයන්.

ඉතින් අපි ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ උතුම් වූ සිතින් ලොවතුරා බුදුරජාණන්වහන්සේගේ උතුම්වූ ඥානයෙන් මේ ගාම්භීර වූ ධර්ම පරාසයන් උන්වහන්සේගේ යෝනිසෝමනසිකාරයෙන් සිහියෙන් ඒ අරමුණට ඉතාමත්ම ලංවෙලා ඉතාමත්ම වේගයෙන් ඒ අරමුණට වැඩම කරලා ඒ අරමුණ දැනගෙන ඒ ධර්ම කොටස් හඳුනාගෙන ඒවාගේ තිබෙන්නාවූ විවිධ පැතිවලින් විවිධ තැන් වලින් ඇති වෙන්නාවූ උපකාරක වන ස්වභාවය උපකාර වී යන ස්වභාවය උපකාර ලබන ධර්ම ස්වභාව ඔක්කෝම මතු කරගෙන පහළ කරගෙන අවබෝධ කරගත්ත. ඒ අවබෝධ කරගත්තාවූ ඒ නුවණට අපි ගරු කරන්ට ඕනෑ.වඳින්ට ඕනෑ පුදන්ට ඕනෑ - සිතෙන් වඳින්ට ඕනෑ - ගරු කරන්ට ඕනෑ - කායික වශයෙන් වඳින්ට ඕනෑ - ගරු කරනට ඕනෑ - වාචසික වඳින්ට ඕනෑ - ගරු කරනට ඕනෑ. ඇයි එහෙම කරන්නේ. එහෙම කරන්නේ අපිට ඒ බුදුරජාණන්වහන්සේගේ සිතින් ඒ ඥානයෙන් අවබෝධ කරගත්ත විශේෂ සැප ශාන්ත ස්වභාවයක් තියෙනවා. විශේෂිත සැප ඇති තැනක් තියෙනවා. එතෙන්ට අපිටත් එක්වෙන්ට ඕනෑ. ආන්න ඒක නිසයි අපි බුදුරජාණන්වහන්සේගේ මේ සියුම් වෙච්ච සියුම් ධර්ම හඳුනාගන්න අවබෝධකරගන්න ඥානයන්ට නමස්කාර කරන්නේ - පූජා කරන්නේ - වන්දනා කරන්නේ. ඒ නිසා මේ ඉදිරි කාලය අපි දැන් මේ කියාපු ටිකේ යම්කිසි කොටසක් තිබුනොත් ඒ ටික සාකච්ඡා වශයෙන් සාකච්ඡා කරමු. ඉදිරිපත්කර ගෙන මෙනෙහි කරමු නැවත වතාවක්. අපේ පිංවත් සැම දෙනාටම ඒ සඳහා අවස්ථාව තියෙනවා. ඉස්සරවෙලාම මට දැනගන්ට ඕනෑ අපි අද ඉදිරිපත් කරපු ධර්ම කාණ්ඩයේ කියවෙච්ච ධර්මකරුණු 4 තේරුනාද කියන එකයි. ධර්ම කරුණු හතරයි මම කිව්වේ. ඒ ධර්ම කරුණු 4 තේරුනානම් ඉස්සරහට අපි යාගන්න පුළුවන්. දැන් මේ හිතන්නෙ යන්නේ 9 වෙනි ප්‍රත්‍යය ධර්මය. තව තියෙනවා 24 සම්පූර්ණවෙන්න තව ගොඩක් තියෙනවා මේ පට්ඨාන ධර්ම කරුණු. සමහර තැන් තියෙනවා සමානයි නමුත් නම් වශයෙන් වෙනස් ගතියකුත් තියෙනවා. සමහර ඒවා හරි අමාරුයි. ඉතින් විශේෂයෙන්ම පට්ඨානය කියල කියන්නේ විවිධ උපකාර ලබාගෙන පහළ වෙන්නාවූ ධර්මනේ. ඒක නිසා විවිධ උපකාර ගත්තයින් පස්සේ අර කසාය කෝප්පයේ තිබෙන්නාවූ බෙහෙත් යම් කිසි ලෙඩක් සනීප කිරීම සඳහා විවිධ විදියට උදව් වෙනවා උපකාර වෙනවා වගේ එක ධර්මයකට එක තැනකට සහ එකතැනකින් තවත් තැනකට විවිධ විදියට මේවගේ ක්‍රියාකාරී ස්වභාවයන් තියෙනවා. ඒවා හඳුනාගැනීමට මේ පින්වතුන්ට ඒ සම්බන්ධයෙන් මොනවා හරි තිබෙනවා

නම් ප්‍රශ්නයක් අහන්ට සහ දැනගනීමට අපි මේ ඉදිරි කාලය පාවිච්චි කරමු. සැමදෙනාටම මේ උතුම් ගාම්භීර ධර්‍ම, ටික ටික හරි කාණ්ඩ කාණ්ඩ වශයෙන් හරි මෙනෙහි කර කර මෙනෙහි කර කර ගොස් ඒ තුලින් හොඳ පිරිසුදු මනසිකාරය හදාගෙන ආත්ම දෘෂ්ටිය නසාගෙන කඩාගෙන බිඳගෙන බුදුරජාණන්වහන්සේලාගේ උතුම් වූ ප්‍රඥාවෙන් දැක දැන අවබෝධකරගත්තාවූ නිවනින් සැනසෙන්ට නිවනින් නිවීයන්ට නිවනින් සසර දුක හේතු ඵල ධර්‍ම අවසන් කරන්ට ලැබේවා! ඒ සඳහා මෙය උතුම් ප්‍රතිපදාවක් වේවා! කියල මෛත්‍රියන් ප්‍රාර්ථනා කරනවා. සැමදෙනාටම තෙරුවන් සරණයි! ඉදිරි කාලය අපි ප්‍රශ්න සාකච්ඡා හැටියට ගන්න පුළුවන්. තෙරුවන් සරණයි!

<u>ජයන්ත මහත්මයා</u> - තෙරුවන් සරණයි ස්වාමීන් වහන්ස අප්‍රමාණ පිං අද ඔබවහන්සේ විසින් කරන ලද දේශනයට. ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ අපිට කරුණු 4 ක් මතක් කරා. ඒ කරුණු 4 කියන කොට මතක් වෙන්නේ උපනිශ්‍රය ප්‍රත්‍යය කියන එකේ තේරුම් පැහැදිලි කළා. ඒ වාගේම ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යයත් ඒවාගේම අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යයත් ප්‍රකෘති උපනිශ්‍රය ප්‍රත්‍යයත් කියන එකත් පැහැදිලි කළා. මම හිතන ඒ වචන 4 වෙන්න ඕන කියල ඔබවහන්සේ අපිට මතක් කරේ. ඉතින් මම ගෞරවයෙන් කල්‍යාණ මිත්‍රයන්ට යොමුවෙනවා අද ස්වාමීන් වහන්සේ අපිට කියා දීපු ඒ කොටස් ගැන යම් විදියකට තමන්ට තේරෙනවා නම් ඒ පිළිබඳවත් විස්තරයක් කරන්න. ඒවගේම යම් කිසි ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒකට අවස්ථාව තියෙනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන් වහන්ස මෙතෙන්දි නිශ්‍රය ප්‍රත්‍යය වෙනවා කියල කිව්වේ භූමියක් වශයෙන් උපකාර වෙනවා කියන එක. ඒවගේම මෙතැන උපනිශ්‍රය ප්‍රත්‍යය කියල කිව්වේ මූලික වශයෙන්ම විශේෂයකින්ම ප්‍රත්‍යය වෙනවා කියන එක. එතෙන්දි ආරම්මණ ප්‍රත්‍යය ගත්තම අපි මීට කලින් කථා කරලා තියෙනවා ආරම්මණ අධිපති ප්‍රත්‍යය කියල. ඒ කියන්නේ ආරම්මණය අධිපතිත්වයෙන් වැඩ කරන අවස්ථාව කියල ස්වාමීන් වහන්ස. එතකොට ඒ දෙක සමාන්තර වන බවක් තේරෙනවා ස්වාමීන්වහන්ස.එහෙම හිතුවොත් හරිද ස්වාමීන් වහන්ස ඒ කියන්නේ ආරම්මණ අධිපති ප්‍රත්‍යයට ප්‍රත්‍යය වන දේවල්ද එහෙමත් නැත්නම් ඒ විදියටමද මේ ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යයත් සිද්ධ වෙන්නේ කියල ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - ඔව් අපි දහම් වැඩ සටහන පටන්ගෙන මුල් අවස්ථාවලදී අපි අපේ පින්වතුන්ට මතක් කළා මේ එක ධර්මයක් තවත් එහෙකට උපකාර වෙන විදිය එකම විදියක් නෙවෙයි. ඒක තුන් හතර ක්‍රමයකින් උදව් වෙනවා උපකාර වෙනවා. එහෙම ස්වභාවයක් තියෙනවා. ඒක නිසා ඔය ආරම්මණය අධිපති ස්වභාවයෙන් තිබෙනවා - ආරම්මණ ස්වභාවයෙන් තිබෙනවා - උපනිශ්‍රය ස්වභාවයෙනුත් තිබෙනවා විශේෂ කාරණයක් හැටියට. ඕක අපි භාවිතා කරන්නේ හරියට උදාහරණයක් අරගෙන අපි map කරනවා ඒක. එතකොට තමයි ඕක තේරෙන්නේ. උදාහරණයක් අරගෙන ඒ උදාහරණයේ ගැට ගහල තමයි අපි මේක සරල කරලා තේරුම් ගන්න මහන්සි ගන්නේ.

අපි හිතමු මෙහෙම. දැන් කෙනෙකුගේ උපන් දිනයක් තියෙනවා. අපි උපන් දින සලකන්නේ නෑ. අපි හිතමු ලෝකයේ ව්‍යවහාරයේ හැටියට උපන් දිනයක් තියෙනවා. උපන් දිනයට

කේක් එකක් හදනවා. ඒ කේක් එක ඒ ස්ථානයේ ආකාර කීපයක් නියෝජනය කරනවා. එකක් තමයි උපන් දිනය කියන එකේ ප්‍රධාන අංගයක් ඕක. උපන්දිනය කියන එකේ ප්‍රධාන අංගයක් cake එක ඒවාගේම තමයි හැම එක්කෙනාටම කෑමකුත් තියෙනවා ඕකේ. ඒක ප්‍රධාන අංගයක් - කෑමක් - ඒවගේම photo ගහන්ට කාරණයක් වෙනවා. දැන් ඔය තුනක් විතර තියෙනවනේ ඕකේ. ඔහොම නෙමෙයි තව ගොඩක් ඕකේ තියෙනවා. එතකොට තව එකක් ඕකේ තියෙනවා යම් කිසි රටක හරි ගමක හරි පළාතක හරි සංස්කෘතික අංගයක් හැටියටත් ඕක ඉස්සරහට යනවා. තව එකක් තියෙනවා. දැන් එක ධර්මයක් - එක කාරණයක් තවත් එහෙකට උදව් වෙන්න - තවත් එහෙකට උදව්වට - උපකාරවෙන්ට ක්‍රම කීපයක් තිබෙනවා. ඕකේ තව තියෙනවා - දැන් බුදුරජාණන් වහන්සේ අවබෝධ කරගෙන දේශනා කරන්නේ නැතුව තියෙන ධර්ම ගොඩාක් තියෙනවා කියනවනේ. එහෙම තියෙනවා. කොසඹෑනුවර ඉන්නකොට ඇට්ටේරියා වනයේ කොළ ටිකක් අතට අරගෙන උන්වහන්සේ භික්ෂුන් වහන්සේලාගෙන් අහනවා “මගේ අතේ තියෙන කොළ ටිකද වැඩි කැලේ තියෙන කොළද වැඩි” කියල. හරි සරලව භික්ෂුන් වහන්සේලා පිළිතුරු දෙනවා “අතේ තියෙන කොළ ටික හරි අඩුයි, වනාන්තරේ තියෙන කොළ ටික හරි වැඩියි” කියල. ආන්න ඒ වාගේලු බුදුරජාණන් වහන්සේ අවබෝධකරගත්ත දේශනා කරපු ධර්මය. අවබෝධ කරගෙන දෙසන්නේ නැතුව තියෙන ධර්මය අර විදියට කැලේ කොළ වගෙයි. දේශනා කරපු ටික බොහොම පොඩ්ඩයි හරියට අතේ තියෙන කොළ ටික වගෙයි. දැන් ප්‍රත්‍යය ධර්ම සම්බන්ධයෙන් කථා කරන කොට සාමාන්‍යයෙන් පෘතක්ජන මනුෂ්‍යකුගේ හිත මේ සංසාර වට්ටෝරුවෙන් - හේතු ඵල ධර්ම ගැටයෙන් ලිහිල නිවනට යාගන්ට ප්‍රමාණවත් වෙච්ච ටිකක් තමයි ඕකේ තියෙන්නේ. තව ඇතියි කියල මම හිතනවා. තව අනන්තයට ඇති. ආරම්මණ ප්‍රත්‍යය - ආරම්මණ අධිපති ප්‍රත්‍යය - ඒවාගේම ආරම්මණ උපනිශ්‍රය ස්වභාවය කියන ඔය ටික - ආකාර තුනම එකම ධර්මය අනෙත් ඒවාට උදව්වෙන උපකාර වෙන ප්‍රත්‍යය වෙන ස්වභාවය ඔය විදියට තියෙනවා. ඒක නිසා එහෙම එක ධර්මයක් අනෙත් ධර්ම වලට අමුතු අමුතු විදිටය උපකාර වෙනවා. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - අවසරයි ස්වාමීන් වහන්ස අද ස්වාමීන් වහන්සේ අපිට පැහැදිලි කරදීපු විදියට අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යය ගැන, එතකොට ස්වාමීන්වහන්ස අපි ඉස්සෙල්ල කථාකරපු අනන්තර සහ සමනන්තර යන දෙක මෙතනත් සමනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යය කියල දෙකම සම්බන්ධ කරලා එහෙම හිතුවට කමක් නැත්ද ස්වාමීන් වහන්ස. (ප්‍රශ්නය පැහැදිලි මදි)

<u>පිළිතුර</u> - අනන්තර ප්‍රත්‍යයයි සමනන්තර ප්‍රත්‍යයයි වෙනස් මහත්තය. මෙතෙන්ට ගැලපෙන්නේ අනන්තර ප්‍රත්‍යය ගුණය විතරයි. අනන්තර ප්‍රත්‍යය කියල කියන්නේ සිතක් අපිට අගිස්සෙන් පහළ වෙනකොට හේතු වෙන්නාවූ කාරණය. එහෙම නැත්නම් අග්ගිස්සෙන් පහළ වෙන්නාවූ හිතට මුලින් තිබෙන හිතේ අනන්තර ස්වභාවය තිබෙනවා. මෙතන උපනිශ්‍රයට ගන්නේ අනන්තර උපනිශ්‍රය කියල ඒකෙ යම්කිසි හිතන්න තියෙනවා කාරණයක්, හරිම සියුම්. හරිම සියුම්. ඒ තමයි හිත් පේළියක කෙළවරක් නැත්නම් අලුතින් එන හිතකට එන්න බෑ - ඒක දක්වන්ට තමයි අනන්තර ස්වභාවයම උපනිශ්‍රය ගුණය දාල කියල තියෙන්නේ. දැන් තියෙනවා එක වස්තුවක තවත් එහෙකට උදව්වෙන උපකාර වෙන ආකාර ස්වරූප ගණනාවක් තිබෙනවා. ඒක මෙතෙන්ට ගත්තයින් පස්සේ අනන්තර ස්වභාවය අනන්තර වශයෙනුත් තියෙනවා. ඒවාගේම විශේෂ ගුණයක් හැටියටත් ඒක

තියෙනවා. අර සමනන්තර ස්වභාවය ගන්නේ මහත්තය හරියටම ගැලපෙනම එක ගන්ටයි. ඒ කියන්නේ ඒකට සුදුසුම සිතක්. සුදුසුම චෛතසික ධර්ම ප්‍රමාණයක් තිබෙන සිතක්. හොඳටම ගැලපෙන ඒකට කියනවා සමනන්තර ස්වභාවය කියල. මෙතැන තිබෙන්නේ - ගන්නේ අනන්තර ගුණය උපනිශ්‍රය වශයෙන්.

බොහොම පිං ස්වාමීන් වහන්ස.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන් වහන්ස කිසියම් ධර්මයක් චිත්තයකට සහ චෛතසික වලට ආරම්මණ නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය උනොත් එහෙම එම ධර්මය අනිවාර්යෙන්ම ආරම්මණ සහ ආරම්මණ අධිපතිප්‍රත්‍යයන්ගෙනුත් ප්‍රත්‍යය වෙනවාද? එහෙමනම් ඒ තුනම එකට සිද්ධ වෙනවාද ස්වාමීන් වහන්ස?

<u>පිළිතුර</u> - එහෙම තියෙනවා මහත්තයා. අර ජයන්ත මහත්තය අහපු ප්‍රශ්නෙත් තිබුනේ ඕකම තමයි. එක ධර්මයක් අනෙත් එහෙකට ප්‍රත්‍යය වෙන ආකාර වල් තිබෙනවා. සමහර වෙලාවක තිබෙනවා එක ධර්මයක් එකම තැනක නොවෙන්න පුළුවන්. එකම වෙලාවක නොවෙන්න පුළුවන්. නමුත් ඒකෙ තිබෙනවා එක ධර්මයක් අනෙත් එකකට උපකාර වන්නාවූ ආකාර. අධිපති වශයෙන් උපකාර වෙන වෙලාවල් තිබෙනවා - ඊළඟට උපනිශ්‍රය වශයෙන් උපකාර වෙන හැටියක් තිබෙනවා. ආරම්මණ වශයෙන් උපකාර වෙන ස්වභාවයක් තිබෙනවා. ඒ මහත්තය ඇහුවේ ඒක තමයි.

ස්වාමීන් වහන්ස නමුත් දැන් ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන දෙයක් එපමණකින්ම ඉවර වෙන්න පුළුවන්නේ. ආරම්මණ අධිපති නොවෙන්නත් පුළුවන් එහෙම නේද අපේ හාමුදුරුවනේ? එසේ නමුත් ආරම්මණ අධිපති එහෙම නැත්නම් ආරම්මණ නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය උනොත් එහෙම ඒ කියන්නේ දැන් මෙතැනදී ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කිව්වට පස්සේ අධිපති ගතියත් එතන අනිවාර්යෙන්ම මුල් වෙන ගතියක් ඔබ වහන්සේ අපිට කියල දුන්න. එහෙමනම් ඒක අපට සලකන්න පුළුවන් ආරම්මණ උපනිශ්‍රය වශයෙන් ප්‍රත්‍යය උනත් එම ධර්මයම ආරම්මණ අධිපති වශයෙනුත් ප්‍රත්‍යය උනා එය ආරම්මණ වශයෙනුත් ප්‍රත්‍යය උනා කියල තුනෙන්ම ප්‍රත්‍යය උනා කියල?

<u>පිළිතුර</u> - ඒක තමයි මහත්තය කිව්වේ. සුවිසි ප්‍රත්‍යය ධර්මවල සංඛ්‍යාවන - ගණන් වන කරුණු අනුව ඔතන කරුණු තුනක් එකට එනවා. දැන් මම ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ සර්වඥතාඥානයේ තිබෙන්නාවූ ස්වභාවය ගැන උන්වහන්සේගේ දේශිත සූත්‍රයක් අනුසාරයක් හිතුවට පස්සේ හිතෙනවා ඔච්චරමත් නෙමෙයි තවත් ඕකේ ඇතෙයි කියල. නමුත් ඒක මම හිතන තාලයක්. තුනක් විතරක් නෙමෙයි තවත් ඕකේ අනන්තයක් ඇති. නමුත් බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තියෙන්නේ මේ ප්‍රමාණය. හේතුව අපේ මනසට ග්‍රහණය කරගන්ට නිවන් දක්නට මේ ටික ඇති. මෙනෙහි කරගන්න ප්‍රමාණවත් වෙයි. නමුත් එක වෙලාවක ඒදේ වෙනවා මහත්තය. එක වෙලාවක ආකාර කීපයකින් අනිත්දේට උපකාර වෙනවා. ඒකම තමයි අර මහත්තයත් ඇහුවේ. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි සවමීන්වහන්ස!

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන් වහන්ස අපි පසුගිය සතියේදී සාකච්ඡා කරන කොට නිශ්‍රය ප්‍රත්‍යයයේදී ස්වාමීන් වහන්ස අපිට කෙටියෙන් මතක් කරලා දුන්න වස්තු පුරේජාත නිශ්‍රයත් ඒවගේම වස්තු ආරම්මණ කියන එකත් බොහොම කෙටියෙන් කියල දුන්න පසුව යම්කිසි අවස්ථාවකදී නැවත සාකච්ඡා කරනවද කියල දැන් ගන්න කැමතියි ස්වාමීන් වහන්ස.

<u>ස්වාමීන් වහන්සේ</u> - ඒක හරි වැදගත් තැනක්. අපේ ජයන්ත මහත්තය ඒක අහපු එකත් හොඳයි. අපි බලමු අපේ ධර්ම මණ්ඩලයෙන් ඒ නිශ්‍රය ප්‍රත්‍යය දැනගැනීමට අපේ පින්වතුන් ඒකට සූදුසුයි ද කියල ඉස්සෙල්ල. ඒක හරී පරෙස්සමින් හිතේ තැන්පත් කරන්ට ඕනෑ. අපේ පින්වතුන් නිශ්‍රය ප්‍රත්‍යය දැන ගත්ත නේද? ඒක හරි වැදගත් තැනක් හැබැයි පරෙස්සමින් ඔළුවට දාල තියන්න ඕන. ඒකෙ වචන දෙකක් තියෙනවා. වචන දෙකත් පටලැවෙනවා. හැබැයි මම කියන්න කැමතියි.

නිශ්‍රය ප්‍රත්‍යයෙන් කියන්නේ, හොඳට බලන්න. විස්තර කිරීම නෙමෙයි කියන්නේ නමුත් මේ වචන දෙක 'වස්තු පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය'. ඔන්න බලන්ට ඊළඟට එන එක. 'වස්තු ආරම්මණ පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය'. ඒ වචනයෙන් කියනකොටත් නිකං එක සමාන ගතියක් තියෙනවා. මේක නිශ්‍රය ප්‍රත්‍යයක්. යමක් හට ගන්න භූමියක් ක්ෂේත්‍රයක් field එකක් වස්තුවක් වෙන හැටියට තමයි කියන්නේ. ඒක දෙයාකාරයකට වෙනවා. මේ ටික තේරෙනවද?

<u>පද්මසිරි මහත්මයා</u> - තෙරුවන් සරණයි ! වස්තු පුරේජාත කියන කොට කලින් පහළ වෙච්ච වස්තුව පාදක කරගත්ත බව එතන කියවෙනවා. අනිත් එකේදී 'වස්තු ආරම්මණ පුරේජාත' කියන තැන නම් හරියට තේරෙන්නේ නැහැ හාමුදුරුවනේ.

<u>ස්වාමීන්වහන්සේ</u> - ඒක බොහොම හොඳයි මහත්තය ඒ අර ඉස්සෙල්ල කියපු එක හරි. අර වස්තු පුරේජාත කියන එක ඒ මහත්තය තේරුම් ගත්තු එක හරි. දැන් අපි ක්ෂණයට යන්නේ නැතුව ටිකක් ඕලාරික විදියට යන්. 'වස්තු පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය' - වස්තුවක් තියෙනවා ඉස්සරවෙලා පහළ වෙලා. ඒ කලින් පහළ වෙච්ච වස්තුව චිත්ත චෛතසික ධර්මයන්ට නිශ්‍රය වෙනවා කියන එක. මතකනේ අපි කිව්වා පුරේජාත ප්‍රත්‍යය ගැන කථා කළා. ඔය පුරේජාත ප්‍රත්‍යය ගැන කථා කරනකොට මම පොඩි උදාහරණ දෙක තුනක් කිව්වා. එකක් තමයි ඉර හඳ තියෙනවනේ. දැන් මේ ඉර හඳ අපි කියනවා - ක්ෂණයෙන් ක්ෂණයෙන් නැතිවෙන එක නෙමෙයි. ඒක තියෙනවා ඒක අපිට පෙන්නේ නැනේ. දැන් මේක අවුරුදු කෝටි ගානක් එහා පැත්තේ පහළ වෙච්ච එකක්නේ. දැන් ඒකෙන් තමයි මුළු ලෝකයටම... ..ඉස්සර වෙලා ඉර පහළ උනා පස්සේ පස්සේ ඇමරිකාවේ එංගලන්තේ ඉන්දියාවේ චීනේ ලංකාවේ මැලේෂියාවේ සිංගප්පූරුවේ පස්සේ පස්සේ පහළ වෙච්ච මිනිස්සුන්ගේ හිත්වල පහළවෙන ඔය අදහස්, ඉරගැන හිතෙන හිතුවිලි සියල්ලක්ම පහළ වෙන්ට හේතු උනේ කලින් පහළ වෙච්ච ඉරනේ. කලින් පහළ වෙච්ච හඳ. භූමියත් ඒවගේමයි. දැන් ඉස්සර වෙලා භූමිය පහළ වෙනවා - පොළව. ඒ පහළ වෙච්ච පොළවේ ඊට පස්සේ ඉඩම් බෙදනවා. ඊට පස්සේ ඒකෙ අයිතිය පවරනවා. පස්සේ පස්සේ පහළ වෙන අය අපේ තාත්තලාගෙන්

අපු ඉඩම - පරම්පරාවෙන් අපු ඉඩම් - දෑවැද්දට ලැබිච්ච ඒවා තෑගි ඔප්පු හම්බ වෙච්ච කියල ඔය නොයෙක් සිතුවිලි පහළ කරනවනේ. ඒ ඔක්කොම සිතුවිලි තෑගි ඔප්පු අරව මේවා හදන්ට කියන්ට ලියන්ට ඉඩම පහළ උනේ ඒ ගොල්ල ඉපදෙන්න කලින්නෙ. ඒක නිසා පුරේජාතයි මේ භූමිය. ඉර කියන එක පුරේජාතයි. හඳ කියන එක පුරේජාතයි. ඊළඟට ඒ පුරේජාත වෙච්ච එකක් තමයි පස්සේ පස්සේ හිත්වලට හැදෙන්ට පහළ වෙන්නේ. දැන් ඔය ටික ඔහොම කිව්වා

අනිත් එක තමයි මෙතන වස්තු කියල කියන්නේ ඊටත් වඩා අපේ ඇඟට බද්ධ කරගෙන තියෙන්නේ. අපේ ජීවිතයට බද්ධ වෙච්ච වස්තු ආරම්මණ. ඔය ඉරයි හඳයි පොළවයි මම උදාහරණයක් හැටියට කිව්වේ. මේකේ අපට තියෙනවා ඇහැ වස්තුවක් - කන වස්තුවක් - නාසය වස්තුවක් - දිව ප්‍රසාද වස්තුවක් - කය ප්‍රසාද වස්තුවක් - හෘදය වස්තුව ප්‍රසාද වස්තුවක්. දැන් මේ ඇහැ කන නාසය දිව ශරීරය යන මේ වස්තූන් අපි චිත්තක්ෂණ කථාව අයින් කරලා අපි හිතමු මේව අපිට පහළ උනේ උපන් දා ඉඳල කියල. ඉතින් ඒ උපන් කාලේ ඉඳලාම, කලින් පහළ වෙච්ච ඇහැකින් කලින් පහළ වෙච්ච කණකින් ශබ්ද අහනවා රූප බලනවා. ඔය කලින් පහළ වෙච්ච ඇස කන නාසය දිව ශරීරය කියන්නාවූ වස්තු නිසා ඒ ටිකනේ පස්සේ පස්සේ පහළ වෙන්නාවූ හිත්වලට උපකාර වෙන්නේ. දැන් බලන්ට අපි මේ කලින් පහළ වෙච්ච ඇහැ ඇරලා බලනවා. බලලා ඔය කන්දක් දිහා හරි ලස්සනයි කියනවා. රෝස මලක් දිහා බලල හරි ලස්සනයි කියනවා. ලෝභ සිත් පහළ කර ගන්නවා. ඒවගේම ගැටීම සිත් පහළ කරගන්නවා. ආසා සිත් පහළ කර ගන්නවා. ඔය ඕවා පහළ වෙන්ට පස්සේ පස්සේ සිතුවිලි පහළ වෙන්ට කලින් පහළ වෙච්ච ඇස නාසය දිව ශරීරය උදව් උනා. ඔන්න ඒකට කියනවා වස්තු පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය කියල. කලින් පහළ වෙච්ච වස්තුව තමයි පස්සේ හිත් වලට නිශ්‍රය වෙන්නේ.

හැබැයි තව එකක් තියෙනවා. ඒක හරි පරෙස්සමින් තේරුම් ගන්න ඕනෑ. ඒකෙ තියෙන විදිය බලන්නකෝ. ‘වස්තු ආරම්මණ පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය’ ඒකනේ තියෙන්නේ. වස්තු ආරම්මණ, පුරේජාතයි. හැබැයි ඒක ඇහැට කනට නාසයට දිවට සම්බන්ධ වෙන්නේ නෑ. ඇහැ කන නාසයට නෙවෙයි. මේක හැබැයි හිතට සම්බන්ධ වෙන්නේ. මෙහෙම හිතමු දැන් ඔන්න අපි උපකල්පනය කරමු. අපි භාවනා කරනවා. භාවනා කරලා භාවනා කරලා භාවනා කරලා උපදවගන්නවා හොඳට ධ්‍යාන හතරම හදා ගන්නවා. දැන් හතරවෙනි ධ්‍යානය තිබෙනවා. දැන් හතරවෙනි ධ්‍යානය පහළ වෙන්නේ ඇහේ නෙමෙයි. කනෙත් නෙමෙයි. නාසයේ දිවේ ශරීරයේත් නෙමෙයි. එතකොට ධ්‍යාන පහළ කර ගැනීමේදී මේ වස්තු පහ ප්‍රයෝජනයක් නෑ. මේවා ප්‍රයෝජනයට ගන්නේ වට පිටාවේ තියෙන ශබ්ද රූප අරව මේවා පට්ටල කරගන්න නේ. මේ පහම වැඩ කරන්නේ නෑ. දැන් ධ්‍යාන සිත් පහළ උනේ හෘදය වස්තු රූපය ආශ්‍රය කරගෙන. හෘදය වස්තුව ආශ්‍රය කරගෙන තමයි පහළ වෙන්නේ. දැන් ධ්‍යාන සිතක් තියෙනවා. ඔය ධ්‍යාන සිතේ අපි හොඳට සංවර වෙච්ච ධ්‍යාන සිතෙන් හොඳට සමාධි කරගෙන ධ්‍යාන සිතත් සිත පහළ වෙන්නෙත් හෘදය වස්තුව ආශ්‍රය කරගෙන. රූපමය වස්තුවක් නැතුව මේ පංච වෝහාර භවයේ සිත් පහළ වෙන්නේ නෑ. ඒක නිසා හිත පහළ වෙන්ටත් යම්කිසි රූප ආශ්‍රයක් තියෙන්න ඕනෑ. එතකොට හෘදය වස්තුවෙනේ ඒක තියෙන්නේ. දැන් අභිඥා ගතකර ගත්ත ධ්‍යාන සිතෙන්ම ඒ ධ්‍යාන සිත පහළ වීමට ආශ්‍රය කරගෙන - භූමිය කරගෙන - නිශ්‍රය කරගෙන තිබෙන්නාවූ ‘රූපයම’ ඒ ‘හිතෙන්ම’ බලනවා.

ඒක ඇස කන නාසයට කරන්න බෑ. ඒක මනෝද්වාරික වශයෙන් පහළ වෙන සිත් වලට විතරයි කරන්න පුළුවන් කම තියෙන්නේ. එතකොට වස්තුව පහළ උනා කලින් - හෘදය වස්තු රූපය කලින් පහළ උනා. ඊළඟට ඒ හෘදය වස්තු රූපය පස්සේ පහළ වෙන්නාවූ සිත් වලටත් අරමුණක් හැටියටත් ඉදිරිපත් වෙනවා. කලින් 'වස්තුවක්' හැටියටත් පහළ උනා. ඒක 'අරමුණක්' හැටියටත් පහළ උනා. 'වස්තුවයි' 'අරමුණයි' දෙකම ඉස්සරවෙලා පහළ වෙලා තිබෙනවා - 'වස්තු ආරම්මණ පුරේජාතයි'. වස්තුවක් හැටියටයි අරමුණක් හැටියටයි දෙක ඉස්සෙල්ල පහළ වෙලා. පස්සේ පහළ වෙන්නාවූ හිත් වලට ඒක භූමියක් වෙනවා. ඔන්න ඕක ටිකක් අමාරුයි කෙනෙකුට ග්‍රහණය කර ගන්ට. මම ඔය එක විදියකට තමයි කිව්වේ.

මෙහෙම තවත් එකක් තියෙනවා. තව පොඩි උදාහරණය කියන්නම් මේක තේරුම් ගන්ට. මේ පින්වතුන් ගිහිල්ලා ඇතිනේ කණ්ණාඩි ගාවට. මේක හිතල බලන්න කොහොමද වෙන්නේ කියල. කණ්ණාඩියක් ළඟට ගියහම කණ්ණාඩියට තව කණ්ණාඩියක් අල්ලනවා. face to face එතකොට මේ කණ්ණාඩියෙන් අර කණ්ණාඩිය පේනවා. මේ කණ්ණාඩියෙන් ඒ කණ්ණාඩිය පේන කොට ඒකෙ තිබෙනවා ප්‍රතිබිම්බය ගන්න එකයි වස්තුවයි අරමුණු වීමයි ඒ දෙකක් ඒකෙ අස්සේ තිබෙනවා. හැබැයි ඒක ඈතට පෙරහැර වගේ දිගට ඈතට තියෙනවා දැකල තියෙනවා. ඒවගේ, එක වස්තුවක් ඒ වෙලාවට අනෙත් කාරණයට අරමුණකුත් වෙනවා එකම වෙලාවේ කණ්ණාඩිය වගේ ඒවාගේම වස්තුවත් වෙනවා. ආන්න ඒකයි ඔය කියන්නේ. අපි බලමු අපේ පින්වතුන්ට ඕක වැටහුනාද කියල නැත්නම් අපි තව වෙලාවක ඕක ගොඩක් වෙලාව අරගෙන තමයි ඕක කියන්න වෙන්නේ. බලමු තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස කාල වෙලාව ඉක්ම ගිහින් තියෙන නිසා අනිත් දවසේ ඒ ගැන සාකච්ඡා කරමුද ස්වාමීන් වහන්ස.

<u>ස්වාමීන් වහන්ස</u> - හොඳයි අපි එහෙනම් වෙන දවසක් ගමු. එහනම් අපි අද මෙතකින් සන්තෝස වෙමු. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස - ඔබවහන්සේට අනන්ත අප්‍රමාණ පිං අපි වෙනුවෙන් වෙහෙසක් අරගෙන කාලයත් නොසලකා මේ ආකාරයෙන් අපිට මේ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කල මේ ඉතාමත්ම සියුම් ගාම්භීර ධර්මය අපිට මේ ආකාරයෙන් මතුකරලා දෙන ඔබවහන්සේට පතන බෝධියකින් වහ වහා නිර්වාණ ධාතුව අවබෝධ වේවා කියල කලණ මිතුරන් වෙනුවෙන් සවනට සිසිලස වෙනුවෙන් ඔබවහන්සේට අපි ප්‍රාර්ථනා කරනවා පුණ්‍යානුමෝදනා කරනවා ස්වාමීන් වහන්ස. එහෙම නම් අපි අද දවසේ සාකච්ඡාව නිමා කිරීම සඳහා මම ඔබවහන්සේට නැවත වරක් යොමු වෙනවා ස්වාමීන් වහන්ස. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ -</u> හොඳයි හැම දෙනාටම බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයේ ආශීර්වාදය සැලසේවා! අදත් මේ අපි බොහොම දුර්ලභ අමාරු ධර්ම කොට්ඨාසයක් හිතින් ස්පර්ශ කරනට මහන්සි ගන්නේ. සමහර වෙලාවට අපි කෑම කනකොට දතට අහුවෙන ඒවා තියෙනවා. හයිය ඒවා තියෙනවා ඒවා ගොඩක් වෙලා අරගෙන හපනව. සමහර ඒවා තියෙනවා ඒවා

හයිය නැති ඒවා ටිකක් ඉක්මනට හැපුවයින් පස්සේ පොඩි වෙලා යනවා. සමහර ඒවා තියෙනවා දතට අහුවෙන්නේ නෑ ඒ තරම් සියුම් හපන්න බෑ දතට අහුවෙන්නේ නෑ නමුත් නිකං දිවෙන් තොලෙන් දියවෙලා යනවා. මේ සමහර කථාකරන ඒවා සමහර සියුම් ඒවා ඇවිල්ල ඔන්න ඔය වගේ අතිශය සියුම් නිකං දතට අහුවෙන්නේ නැති ඒවා. අපි ඒවගේ ගොඩක් සියුම් පැත්තක් තමයි හිතන්ට මහන්සි ගන්නේ. බුදුරජාණන්වහන්සේගේ පාරමී බලයෙන් ලැබිච්ච සර්වඥතාඥානයෙන් ඒවා හරියට අතේ තියෙන නෙල්ලි ගෙඩිය වගේ තියෙනවා කියනවනේ. ඒ ගැන හිතුවයින් පස්සේ නෙල්ලි ගෙඩියේ තියෙනවා කොල පාට තීරූ තියෙනවා. ඒවගේම නෙල්ලි ගෙඩියේ තියෙනවා නහර වැල් ගියා වගේ ගතියක්. ඕක දුර ගහේ තියෙන කොට පෙන්නේ නැහැ. නෙල්ලි ගෙඩිය අතට ගත්තයින් පස්සේ ඒ කෙඳි කෙඳි වගේ තිබෙන්නාවූ දේවල් නෙල්ලි ගෙඩියේ පාට නෙල්ලිගෙඩියේ තිබෙන්නාවූ කලුපාට පැල්ලම් ඒ ඔක්කොම ටික පේනවා. අතට ගත් නෙල්ලි ගෙඩියක් වගේ කියන්නේ. ඒ සියල්ලම බුදුරජාණන් වහන්සේට දැනුනේ පාරමී ධර්ම ශක්තියෙන්. අපි ඒවා නිවනට සුදුසු ආකාරයට වඩාගෙන වඩාගෙන යන පිරිසක්. පරිපූර්ණ හිතකින් දැකපු දේ සහ අපරිපූර්ණ සිතකින් කථාකරන දේ අතර හරි වෙනස්. ඒවා අතඅරින්නත් හොඳ නෑ. ලෝකයේ මේ දේවල් කථා කරනවා හරිම දුර්ලභයි. දෙවි දේවතාවුන් නම් සාකච්ඡා කරනවා ඇති. බ්‍රහ්මරාජයෝ සාකච්ඡා කරනවා ඇති. මනුස්සලෝකේ කථා කරන්නේ හරි අඩුවෙන්. ඒවගේ දුර්ලභ ගනයේ සාකච්ඡාවක් තමයි අපි මේ පැවැත්තුවේ. ඊට සහභාගී වෙච්ච පින්වතුන් සැම දෙනාම වාසනාවන්තයි. එක එක්කෙනාගේ නුවණේ දැනුමේ තේරුමේ හැටියට අවබෝධයත් ඉතින් එහෙ මෙහෙ වෙන්ට පුළුවන්. ඒ කෙසේ හෝ වේවා කවදාක්වත් හිත පසුබස්ස ගන්න හොඳ නෑ. ඉතින් හොඳ ධර්ම සාකච්ඡාවක් ගැඹුරු පැත්තක් අපි හිතුවේ. ඒ ධර්ම සාකච්ඡාවට අපි යොමු උනේ පිංවත් ලලිත් දළුවත්ත මහත්තය නිසා. ඒ මහතමයාටත් නිදුක් නිරෝගී දීර්ඝායුෂ වේවා! ඒ මහතමයාගේ ධර්ම සංකල්පනා සියල්ල ඉෂ්ට වේවා! ඒ මහත්මයාටත් පවුලේ සැම දෙනාටමත් සුවසේ ගුණ පුරාගෙන නිවනින් සැනසෙන්ට ලැබේවා කියල මෛත්‍රී සිතින් ප්‍රාර්ථනාකළ යුතුයි. ඒවාගේම ධර්ම මණ්ඩලය මෙහෙයුවාවූ පින්වත් ජයන්ත මහතාටත් ප්‍රශ්න ඇසූ ඒ පිංවත් මහත්ම මහත්මීන් ඒවාගේම මේ පින්වතුන් සැමදෙනාටමත් ලෝකවාසී මේ ධර්මය අහන්නාවූ සාකච්ඡාවට බලාගෙන ඉන්නාවූ හිත් යොදන්නාවූ මෙනෙහි කරන්නාවූ සැම සියලු දෙනාටමත් මේ උතුම් ධර්මය සාකච්ඡා කිරීමේ පින ඇසීමේ පින ධර්ම ආනුභාව බලයෙන් ශාන්තියක් සැනසිල්ලක් යහපතක් වේවා! ශ්‍රද්ධාව වැඩේවා! වීර්ය සති සමාධි ප්‍රඥා ගුණ ධර්ම වැඩේවා ! සුවසේ පාරමී ගුණ පුරාගන්ට ලැබේවා! ධර්ම මාර්ගයේ ගමන් කොට කෙලවර සැමදෙනාටම කෙලෙස් නසාගෙන ආශ්‍රව ධර්මයන් නසාගෙන උතුම් නිවනින් සැනසෙන්ට නිවන් අවබෝධ කරගන්ට ලැබේවා! කියා මෛත්‍රීයෙන් පින්දෙමින් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය භන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.